# මාසික වෙළඳ විවරණිකාව


ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා මහ බැංකුව

2021 සැප්තැම්බර්

03 වෙළුම 09 නිකුතුව


## විශේෂ සිදුවීම්





2021 වසරේ සැප්තැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 1,031ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 3.1කින් ඉහළ ගියේය.

2021 වසරේ සැප්තැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,526ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 0.1කින් ඉහළ ගියේය.





2021 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී අපනයන ආදායම සහ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 20.0කින් සහ සියයට 26.8කින් ඉහළ ගියේය.


වෙළඳ ගිණුමේ හිඟය 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 525ට සාපේක්ෂව, 2021 වසරේ සැප්තැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 495ක් දක්වා අඩු විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2021 ජන.- සැප්.)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.- සැප්.)




### අපනයන පරිමා දර්ශකය - (ජන.- සැප්.)





සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී අපනයන ආදායම 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය.


සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන පරිමාවන් ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී අපනයන පරිමා දර්ශකය ඉහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-සැප්.)




### තේ සහ රබර් මිල ගණන් *




* කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වන අතර 2020 වසරේ අප්‍රේල් - අගෝස්තු කාලපරිච්ඡේදයේ දී රබර් වෙන්දේසි මිල ගණන් නොමැත.


ප්‍රධාන වශයෙන් කුළුබඩු, තේ, පොල් සහ මුහුදු ආහාර අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී එළවළු සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම පහත වැටුණි.

## කාර්මික අපනයන


### කාර්මික අපනයන ආදායම





### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-සැප්.)





### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2021 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟලුම්, රබර් නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයන ආදායම පහළ ගියේය.

## ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - (ජන.-සැප්.)





### ආනයන පරිමා දර්ශකය (ජන.-සැප්.)





සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන වියදම් ඉහළ යෑම හේතුවෙන්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2021 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ආයෝජන භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ ආනයන පරිමාවන් ඉහළ යෑම හේතුවෙන්, ආනයන පරිමා දර්ශකය ද ඉහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-සැප්.)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන්





2021 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී පෞද්ගලික රථවාහන ආනයන වියදම පහළ යෑම හමුවේ වුව ද, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගිය අතර, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, විදුලි සංදේශ මෙවලම් සහ ගෘහ උපකරණ ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තෙල් සහ මේද, එළවළු, කිරි නිෂ්පාදිත සහ සීනි හා රසකැවිලි ආනයන වියදම ඉහළ යෑමත් සමඟ ආහාර හා පාන වර්ග ආනයන වියදම ද ඉහළ ගියේය. කෙසේ වුව ද, මුහුදු ආහාර සහ පාන වර්ග ආනයන වියදම පහත වැටුණි.

# අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-සැප්.)




බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)




*2021 වසරේ මාර්තු, ජූනි සහ සැප්තැම්බර් මාසවල බොරතෙල් ආනයනය කර නැත.


ප්‍රධාන වශයෙන් ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, මූල ලෝහ, රසායනික නිෂ්පාදිත සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේ වුව ද, මෙම කාලපරිච්ඡේදය තුළ දී පොහොර, ඛනිජ නිෂ්පාදිත, සහ සකස් නොකළ දුම්කොළ ආනයන වියදම පහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


ආයෝජන භාණ්ඩ ආනයන වියදම




ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-සැප්.)




සියලුම උප කාණ්ඩ වල ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2021 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | සැප්.- 20 | සැප්. - 21 | වෙනස (%) | ජන. -සැප්. 2020 | ජන.-සැප්. 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **222.5** | **221.2** | **-0.6** | **1,738.5** | **1,986.7** | **14.3** |
| එයින් | තේ | 114.0 | 104.1 | -8.7 | 919.6 | 986.6 | 7.3 |
| | පොල් | 35.8 | 35.8 | 0.1 | 257.3 | 312.7 | 21.5 |
| | කුළුබඩු | 38.6 | 37.3 | -3.4 | 233.1 | 319.6 | 37.1 |
| | මුහුදු ආහාර | 16.2 | 22.6 | 39.2 | 149.4 | 188.1 | 25.9 |
| **කාර්මික අපනයන** | | **774.6** | **805.7** | **4.0** | **5,680.0** | **6,899.0** | **21.5** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 433.7 | 458.5 | 5.7 | 3,286.8 | 3,893.3 | 18.5 |
| | රබර් නිෂ්පාදිත | 78.0 | 90.9 | 16.6 | 566.9 | 772.6 | 36.3 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 28.6 | 53.7 | 87.6 | 296.8 | 348.6 | 17.5 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 45.6 | 43.7 | -4.3 | 348.6 | 397.7 | 14.1 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 35.8 | 37.4 | 4.5 | 245.3 | 366.5 | 49.4 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 20.3 | 17.4 | -14.3 | 122.9 | 195.4 | 59.0 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 5.9 | 5.5 | -5.7 | 44.0 | 39.3 | -10.7 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **3.0** | **4.4** | **47.9** | **26.6** | **48.7** | **83.2** |
| **මුළු අපනයන** | | **1,000.0** | **1,031.4** | **3.1** | **7,445.0** | **8,934.3** | **20.0** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | සැප්.- 20 | සැප්. - 21 | වෙනස (%) | ජන. -සැප්. 2020 | ජන.-සැප්. 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **266.5** | **310.7** | **16.6** | **2,566.9** | **2,890.0** | **12.6** |
| **ආහාර හා පාන වර්ග** | | 125.2 | 109.8 | -12.4 | 1,148.9 | 1,261.7 | 9.8 |
| එයින් | එළවළු (ආ) | 16.2 | 23.9 | 47.9 | 262.5 | 302.6 | 15.3 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 141.3 | 201.0 | 42.2 | 1,418.0 | 1,628.3 | 14.8 |
| එයින් | පෞද්ගලික රථවාහන | 0.6 | 2.1 | 240.4 | 281.4 | 9.9 | -96.5 |
| **අන්තර් භාණ්ඩ** | | **883.3** | **848.4** | **-4.0** | **6,575.8** | **8,790.8** | **33.7** |
| එයින් | ඉන්ධන | 214.0 | 201.0 | -6.1 | 1,905.2 | 2,596.8 | 36.3 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 208.3 | 262.2 | 25.8 | 1,665.5 | 2,205.9 | 32.4 |
| | පොහොර | 14.7 | 0.4 | -97.1 | 139.0 | 104.4 | -24.9 |
| | තිරිඟු හා ඉරිඟු | 60.7 | 25.5 | -58.0 | 290.0 | 291.4 | 0.5 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **375.0** | **366.9** | **-2.2** | **2,639.6** | **3,256.7** | **23.4** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 257.1 | 226.8 | -11.8 | 1,581.7 | 2,049.4 | 29.6 |
| **මුළු ආනයන** | | **1,524.9** | **1,526.0** | **0.1** | **11,782.2** | **14,937.5** | **26.8** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | සැප්.- 20 | සැප්. - 21 | වෙනස (%) | ජන. -සැප්. 2020 | ජන.-සැප්. 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -524.8 | -494.7 | - | -4,337.2 | -6,003.2 | - |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | සැප්.- 20 | සැප්. - 21 | වෙනස (%) | ජන. -සැප්. 2020 | ජන.-සැප්. 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 139.2 | 143.5 | 3.1 | 115.1 | 138.2 | 20.0 |
| | පරිමා දර්ශකය | 161.6 | 157.3 | -2.7 | 128.8 | 152.5 | 18.5 |
| | මිල දර්ශකය | 86.1 | 91.3 | 6.0 | 89.4 | 90.6 | 1.3 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 136.5 | 136.6 | 0.1 | 117.2 | 148.5 | 26.8 |
| | පරිමා දර්ශකය | 173.0 | 138.0 | -20.3 | 141.4 | 158.7 | 12.2 |
| | මිල දර්ශකය | 78.9 | 99.0 | 25.5 | 82.8 | 93.6 | 13.0 |
| **වෙළඳ මිල අනුපාතය** | | 109.2 | 92.2 | -15.6 | 108.0 | 96.8 | -10.4 |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු,අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද